මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: බීඩී/සීබීපී/01/01/03-2019
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.12.18

**අයවැය චක්‍රලේඛ අංක 08 /2019**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2019 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම**

**1. පසුබිම**

2019 වර්ෂය සඳහා සම්මත වූ 2019 අංක 06 දරන විසර්ජන පනතෙහි සඳහන් වූ අමාත්‍යාංශ ව්‍යුහය 2019.12.10 දිනැති අංක 2153/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සැලකිය යුතු වෙනසකට බඳුන් විය. ඒ අනුව, 2019 අංක 06 දරන විසර්ජන පනතෙහි කැබිනට් අමාත්‍යාංශ 31 ක් හා කැබිනට් නොවන අමාත්‍යාංශ 06 ක් යටතේ ව්‍යුහගතව පැවති විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන ඉහත ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශ 29 ක් යටතට ව්‍යුහගත කර ඇත.

ඉහත වෙනස්වීම් වල ප්‍රතිඵලයක් ලෙස 2019 අංක 06 දරන විසර්ජන පනත යටතේ පැවති ඇතැම් වැය ශීර්ෂ මේ වන විට සම්පූර්ණයෙන්ම අහෝසි වී ඇති අතර, අදාළ කාර්යයන් වෙනත් වැය ශීර්ෂ එකකට හෝ කිහිපයකට පැවරී ඇත. ඊට අමතරව ඇතැම් වැය ශීර්ෂවල කාර්යයන්ගෙන් කොටසක් වෙනත් වැය ශීර්ෂ වෙත මාරු වී ගොස් ඇති අතර නව කාර්යයන් එම අමාත්‍යාංශ වෙත පැවරී ඇත.

ඉහත දක්වා ඇති මාරුවීම්වලට අනුරූපීව 2019 අංක 06 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් මේ වර්ෂය තුළ ඉතිරිව නොමැත. එබැවින්, 2019 වර්ෂය සඳහා වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කළයුතු වන්නේ 2019 අංක 06 දරණ විසර්ජන පනතේ වැය ශීර්ෂ සඳහා වේ.

මෙම චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණ වන්නේ ඉහත සන්දර්භය තුළ 2019 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඔබ විසින් කටයුතු කළයුතු ආකාරය පැහැදිලි කිරීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම

### 2.1 අමාත්‍යාංශ

නව අමාත්‍යාංශ වෙත 2019 අංක 06 දරන විසර්ජන පනතේ පැවති වැය ශීර්ෂ වෙන්වන ආකාරය මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ දැක්වේ. මහා භාණ්ඩාගාරය විසින් 2019 අයවැය ඇස්තමේන්තුවේ පැවති වැය ශීර්ෂවලට අදාළ විෂයයන් දැනට බෙදී ගොස් ඇති ආකාරය සැලකිල්ලට ගෙන 2019 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම පහත සඳහන් ආරකාරයට පවරනු ලැබේ. ඒ අනුව උපලේඛණයේ (1) වන තීරුව යටතේ දැක්වෙන නව අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙත එහි (2) තීරුවේ දැක්වෙන්නා වූ පෙර පැවති අමාත්‍යාංශවලට වෙන්කරතිබූ වැය ශීර්ෂවලට අදාලව 2019 වර්ෂය සඳහා වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම පවරනු ලැබේ.

ඉහත පරිදි ඒ ඒ වැය ශීර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019.12.03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි උපදෙස් අනුගමනය කරමින් සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා නව අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ඉදිරිපත් කිරීම අදාල පෙර අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ/ ප්‍රධාන ගණකාධිකාරිගේ වගකීමක් වේ.

### 2.2 දෙපාර්තමේන්තු

දෙපාර්තමේන්තුවක් අයත් වන අමාත්‍යාංශයේ යම් වෙනසක් ඇති වුවත් දෙපාර්තමේන්තුවල වැය ශීර්ෂ අංක හා විෂයයන් නොවෙනස් වන බැවින් දෙපාර්තමේන්තුවල ගිණුම් තැබීම පැරණි වැය ශීර්ෂ අංක අනුවම සිදු කළයුතුය. එනමුත් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වනුයේ එම දෙපාර්තමේන්තුව දැනට අනුයුක්ත වී ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

### 2.3 අත්තිකාරම් ගිණුම්

නව අමාත්‍යාංශ අනුව 2019 අංක 06 දරන විසර්ජන පනතේ සඳහන් අත්තිකාරම් ගිණුම් අනුයුක්ත වන ආකාරය උපලේඛනයෙහි 3 තීරුවෙන් දක්වා ඇත. ඒ අනුව අහෝසි වන අමාත්‍යාංශවලට අදාළ අත්තිකාරම් ගිණුම්වලට අදාළව 2019 වාර්ෂික සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම ද පැරණි අමාත්‍යාංශවල ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරීවරුන් වෙත පැවරෙයි. එම ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම නව අමාත්‍යාංශවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීමක් වෙයි.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

**එස්.ආර්.ආටිගල**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

උපලේඛනය

| 2019.12.10 දිනැති අංක 2153/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව නව අමාත්‍යාංශයේ නම<br>(1) | 2019 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පවරන ලද වැය ශීර්ෂ (2019 අංක 06 දරන විසර්ජන පනත ප්‍රකාරව)<br>(2) | අත්තිකාරම් ගිණුම් විෂය අංකය<br>(3) |
|---|---|---|
| බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 101 බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය | 10101 |
| මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | 102 මුදල් අමාත්‍යාංශය | 10201 |
| | 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | 10401 |
| | 53 ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය | 05301 |
| | 56 විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය | 05601 |
| ආරක්ෂක අමාත්‍යාංශය | 103 ආරක්ෂක අමාත්‍යාංශය | 10301 |
| අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 110 අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 11001 |
| | 157 ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 15701 |
| සෞඛ්‍ය දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය | 111 සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 11101 |
| විදේශ සබඳතා අමාත්‍යාංශය | 112 විදේශ කටයුතු අමාත්‍යාංශය | 11201 |
| ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය | 114 ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 11401 |
| මාර්ග මහාමාර්ග අමාත්‍යාංශය | 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 11701 |
| මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය | 118 කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 11801 |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 119 විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය | 11901 |
| කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | 120 කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය | 12001 |
| | 124 ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් | 12401 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 122 ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 12201 |
| අධ්‍යපන අමාත්‍යාංශය | 126 අධ්‍යාපන අමාත්‍යාංශය | 12601 |
| රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130 රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 13001 |
| | 155 අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 15501 |
| වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය | 135 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 13501 |
| ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 140 කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 14001 |

| 2019.12.10 දිනැති අංක 2153/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව නව අමාත්‍යාංශයේ නම<br>(1) | 2019 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පවරන ලද වැය ශීර්ෂ (2019 අංක 06 දරන විසර්ජන පනත ප්‍රකාරව)<br>(2) | | අත්තිකාරම් ගිණුම් විෂය අංකය<br>(3) |
|---|---|---|---|
| කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය | 149 | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | 14901 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 158 | රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය | 15801 |
| සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය | 159 | සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 15901 |
| පරිසර වනජීවී සම්පත් අමාත්‍යාංශය | 160 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 16001 |
| නාගරික සංවර්ධන, ජලසම්පාදන නිවාස පහසුකම් අමාත්‍යාංශය | 162 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 16201 |
| | 123 | නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 12301 |
| උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍යාංශය | 166 | නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 16601 |
| | 52 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය | 05201 |
| වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 176 | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 17601 |
| ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය | 194 | විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 19401 |
| කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 195 | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 19501 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය | 108 | තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 10801 |
| | 51 | ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය | 05101 |
| | 55 | ජනමාධ්‍ය අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය | 05501 |
| නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 54 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය | 05401 |